සී/ස මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළයුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගිරාඳුරුකෝට්ටේ ගොවිපොළෙහි අක්කර 1,113 රූඩ් 0 පර්චස් 37.76 ක ඉඩමේ වටිනාකම සහ දම්මින්න ගොවිපළෙහි අක්කර 100 ක ඉඩමේ වටිනාකම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 17.4 ඡේදය අනුව සමාගම විසින් ගිණුම්ගත කර නොතිබුණි.	ගිරාඳුරුකෝට්ටේ ගොවිපොළ හා දම්මින්න ගොවිපොළේ ඉඩම් තක්සේරු කර සමාගම වෙත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් පවරා නොමැත. සමාගමට එම ඉඩම් පරිහරණය කිරීම සඳහා පමණක් ලබා දී ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(ආ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිත 10.21 අනුව පූර්ව වර්ෂ වැරදි සංසන්දනාත්මකව පූර්ව වර්ෂ සංඛ්‍යා සඳහා ගලපා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළයුතු වුවත්, සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව පූර්ව වර්ෂ වැරදි සංසන්දනාත්මකව ගලපා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	පූර්ව වර්ෂ සඳහා වූ ගැලපුම් ලෙස අයභාර සංචිතයෙන් රු.13,454,122 ක් අඩුකර රු.7,402,549 ක් එකතු කර තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 10.23 අනුව හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.	2025 වර්ෂයේ ඉදිරිපත් කරමි.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව පූර්ව වර්ෂ සඳහා වූ ගැලපුම් හෙළිදරව් කළ යුතුය.
(ඈ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 28.18 අනුව පාරිතෝෂික ගණනයේදී ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන	2025 වර්ෂයේ දී ගිණුම්කරණ ප්‍රමිත 28.18 ට අනුකූලව පාරිතෝෂික මුදල් ගිණුම්ගත කරන බව දන්වා සිටිමි.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන

	පාරිතෝෂික වගකීම් ගණනය කර ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතු වුවද, සමාගම ඊට අනුකූලවී නොතිබුණි.		පාරිතෝෂික වගකීම ගණනය කර ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	වාණිජ දැව වශයෙන් අලෙවි කිරීමට නිර්දේශ කරමින් රු.9,446,800 කට තක්සේරු කර තිබූ දම්මින්න ගොවිපොළෙහි තේක්ක ගස් 195 ක් හා ගිරාදුරුකෝට්ටේ ගොවිපොළෙහි තේක්ක ගස් 211 ක්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41 හි 10 ඡේදය අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම තේකක ගස් තක්සේරු කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් ස්ථානීය වටිනාකම ලබා ගැනීමට හැකි වූයේ 2025 පෙබරවාරි මාසයේදීය. එම නිසා එම ගස් තක්සේරු කර 2025 වර්ෂයේ අවශ්‍ය ගිණුම් වලට ඇතුළත් කරන බව දන්වා සිටිමි.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මෙම ගස් තක්සේරු කර එම වටිනාකම ගිණුම්ගත කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වර්ෂයේ ආදායම් වියදම් නිවැරදිව හඳුනාගැනීම වෙනුවට පූර්ව වර්ෂ මූල්‍ය ප්‍රතිඵලයට ගැලපීම් සිදු කිරීම සමාගම විසින් දිගින් දිගටම සිදුකර තිබීම හේතුවෙන් 2021, 2022 හා 2023 වර්ෂවල විගණිත මූල්‍ය ප්‍රකාශනවල පැවති පිළිවෙලින් රු.1,325,555 ක අලාභය රු.167,815 ක ලාභය හා රු.295,352 ක අලාභය සඳහා පසු වර්ෂයේදී පිළිවෙලින් රු.3,376,919 ක්, රු.2,089,263 ක් හා රු.20,856,669 ක් පූර්ව වර්ෂ ගැලපීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් 2021,2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් රු.1,695,098 ක අලාභයක්, රු.627,268 ක ලාභයක් හා රු.6,346,924 ක අලාභයක් දක්වා මූල්‍ය ප්‍රතිඵලය සියයට 28 සිට සියයට 2048 දක්වා වෙනස් අගයක් ගෙන තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගනිමි.	වර්ෂයට අදාළ ආදායම් වියදම් නිවැරදිව හඳුනාගැනීම සඳහා වගකීම් සහිත පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.
(ආ)	සමාගම සතුව පැවතුණු තඹුත්තේගම පිහිටි නිරාවිය ගොවිපොළ, කන්තලේ ගොවිපොළ, පොළොන්නරුව පිහිටි සිද්ධපුර ගොවිපොළ හා වැලිකන්ද පිහිටි මුතුවැල්ල ගොවිපොළ වර්ෂ 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවකින් තොරව මහවැලි අධිකාරිය වෙත පවරා දී තිබුණි. එම ගොවිපොළවල් සතු එකතු වටිනාකම රු.22,335,573 ක් වූ ස්ථාවර වත්කම්	මෙම වත්කම් 2025 වර්ෂයේදී සමාගම විසින් භෞතිකව සමීක්ෂණය කරන බව දන්වා සිටිමි.	සමාගමට අයත් වත්කම් පමණක් ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.

	සමාගම විසින් භාවිතා නොකරන නමුත්, සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. තවද එම වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් භෞතිකව සමීක්ෂණය කර නොතිබුණි.		
(ඇ)	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු රු.652,809 ක් වූ අධිභාර හා සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු රු.402,513 ක් වූ අධිභාර සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ දී අධිභාරය ගිණුම් ගතකරන බව හා හිඟ මුදල් ගෙවා අවසන් කරන බව දන්වා සිටිමි.	සියළු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	2022 වර්ෂයේ සිදුකළ එහෙත් වියදමක් ලෙස එම වර්ෂයේදී ගිණුම්ගත නොකළ රු.441,111 ක් වූ වාහන අළුත්වැඩියා වියදම සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරියට කළ ගෙවීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.	2025 වර්ෂයේ ලාභ අලාභ ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරමි.	මෙම වියදම 2022 වර්ෂයට අයත් බැවින්, එය පූර්ව වර්ෂ ගැලපීම් ලෙස හඳුනාගෙන ගැලපීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2024 දෙසැම්බර් 31 දිනට අපහරණය නොකළ රු.2,285,000 ක වාහන 5ක් හා ට්‍රැක්ටර් ටේලර් 2 ක් ජංගම නොවන වත්කම් ශේෂයන් ඉවත් කර තිබුණි.	මෙම වාහන 2025 වර්ෂයේදී අපහරණය කිරීමට කටයුතු කරමි.	තවමත් සමාගමේ භාවිතයේ පවතින වාහන 5 සහ ට්‍රැක්ටර් ටේලර් 2 ක්, ජංගම නොවන වත්කම් ශේෂයන් ලෙස නැවත ඇතුළත් කළ යුතුය.
(ඊ)	දීර්ඝ කාලයක සිට ගිණුම්වල ගෙවිය යුතු ලෙස දක්වා ඇති නොගෙවූ හිඟ වැටුප් රු.3,992,144 ක්, සහ ඊට අදාල අර්ථසාධක දායක අරමුදල් රු.1,144,999 ක් හා සේවක භාරකාර දායක මුදල් රු.166,208 ක් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් නඩු පවරා තිබුණද ඒ වෙනුවෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ දී වාරික වශයෙන් ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කිරීම් කළ යුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල රු.	නොසැපයූ සාක්ෂි	විගණනකළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොදු සංචිතය				
(i)	මහවැලි ආර්ථික ඒජන්සිය	388,575,802	වටිනාකම සනාථ කරගත හැකි සාක්ෂි	මෙම ශේෂ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය ලෙස පැවති කාලයේදීම අංශයට ලබා දෙන ලද මුදල් වේ. මේ පිළිබඳව සමාගමේ කිසිදු සටහනක් නොමැත.	ශේෂ සනාථ කර ගැනීමට අදාළ ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ii)	කොත්මලේ කිරි සංවර්ධන අරමුදල	2,900,000	-එම-		
(iii)	යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන	3,583,706	ගිණුම්ගත කිරීමට අදාළ ලියකියවිලි		
(iv)	විදේශ ආධාර	5,729,782	-එම-		
(ආ)	ප්‍රාග්ධන සංචිත	14,159,541	-එම-		

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II කොටසේ 5 (1) වගන්තිය	2020 පෙබරවාරි මස නිරාවිය ගොවිපලේ සේවයෙන් ඉවත්වූ සේවකයන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු රු.1,320,523 ක් වූ පාරිතෝෂික මුදලක් විගණිත දින වූ 2025 මාර්තු 18 දක්වා ගෙවා නොතිබුණි.	2025 වර්ෂයේදී ගෙවීමට කටයුතු කරමි.	ගෙවිය යුතු පාරිතෝෂික මුදල් ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ දෙවන කොටසේ 16 වන වගන්තිය.	2020 ජූලි සිට 2023 ඔක්තෝබර් දක්වා මාස 40ක කාලයක් සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු රු.1,296,426 ක දායක මුදල් ගෙවා නොතිබුණි.	2025 වර්ෂයේ දී හිඟ මුදල් ගෙවා අවසන් කර ඇත.	නියමිත කාලසීමාව තුල දායක මුදල් ගෙවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

(ඇ)	1971 අංක 24 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ දෙවනි කොටසේ 15 වගන්තිය.	2013 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා මාස 98 ක කාලයක් සඳහා සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු රු. 23,444,504 ක දායක මුදලක් විගණිත දින වූ 2025 මාර්තු 18 දක්වා ගෙවා නොතිබුණි.	2025 වර්ෂයේදී කොටස් වශයෙන් ගෙවීමට සැලසුම් කර ඇත.	හිඟ දායක මුදල් ගෙවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.
(ඈ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ II වන කාණ්ඩයේ 102 වගන්තිය.	සමාගම ආදායම් බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණි.	2025 වර්ෂයේ දී අදාළ ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගනිමි.	ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය			
(i)	මෙහෙයුම් අත්පොතේ 3.2 ඡේදය	සියළුම රාජ්‍ය ව්‍යාපාර කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් පටිපාටිය හා ගෙවීම් ව්‍යුහය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය සඳහා යැවිය යුතු වුවත් සමාගම ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ දී කටයුතු කරමි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	රාජ්‍ය ව්‍යවසායක යන්හි යහපාලනය සඳහා වූ මාර්ගෝප-දේශයේ 2.3 ඡේදය	ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම උපාය මාර්ගික සැලසුම, ක්‍රියාකාරී සැලසුම හා වාර්ෂික අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට, ඉදිරිපත් කළයුතු වුවද, සමාගම එසේ කර නොතිබුණි.	කාර්යය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර, 2025 වර්ෂයේදී රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා නොගැනීම සම්බන්ධයෙන් ඊට අදාළ නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම සැලසුම් හා අයවැය ලේඛනය රාජ්‍ය

				ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.
(ඊ)	2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය	රු.11,013,043 ක පාරිතෝෂික වෙන්කිරීමක් හඳුනාගෙන තිබුණද එම මුදල වෙනම ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	පාරිතෝෂික මුදල් වෙනම ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගනිමි.	පාරිතෝෂික ප්‍රතිපාදන වෙනම ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,773,912 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.295,352 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,069,264 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ජෛව වත්කම් තොගයේ සාධාරණ අගය වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේදී භාවිතයට ගත නොහැකි බවට හඳුනාගෙන තිබුණු රු. 9,902,282 ක් වූ ස්ථාවර වත්කම් අපහරණය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම ගිරාඳුරුකෝට්ටේ ගොවිපොළේ නිෂ්කාර්යව තබා තිබුණු පිරිවැය රු.2,351,000 ක් වූ වාහන 6 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණයට කටයුතු කර නොතිබුණි.	හඳුනා නොගන්නා ලද රු.9,453,140 වටිනාකමට අදාළ භාණ්ඩ නැවත වත්කම් ලේඛනයට එකතු කරන ලදි. පසුව 2022 වර්ෂයේ දී අදාළ වත්කම් නැවත හඳුනාගෙන ඉවත් කරන ලදි. 2025 වර්ෂයේදී අපහරණය සඳහා කටයුතු කරනු ලැබේ.	මෙම වත්කම් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණයට කටයුතු කළ යුතුය.

(ආ)	සමාගම විසින් භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් පිරිවැය රු.8,156,000 ක් වූ වාහන 04 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම වත්කම් පරිහරණය කිරීම සඳහා පමණක් සමාගම වෙත පවරා ඇත.	සමාගම් විසින් භාවිතා කරනු ලබන මහවැලි අධිකාරියට අයත් වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විතවී තිබුණු අතර, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම නිකුත් කර නොතිබුණි.	2025 වර්ෂයේදී කොටස් නිකුත් කිරීමට සටහන් කර ගතිමි.	අවශ්‍ය පරිදි කොටස් නිකුත් කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	ව්‍යාපෘති කමිටුව විසින් තෝරා ගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස සමාගම ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව රාජ්‍ය පෞද්ගලික කළමනාකරණයකට ගිවිසුම්ගතවී ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2022 ජනවාරි 18 දිනැති අංක අමප/21/2229/317/025-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින වූ 2025 ජූනි 05 තෙක් එම කටයුතු අවසන් කර නොතිබුණි.	මෙම කාර්යය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදු කරනු ලැබේ.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික කළමණාකරණයකට ගිවිසුම්ගතවී සමාගම ප්‍රතිසංවිධානය කිරීම කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය		කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගමේ සාංසමික සංස්ථා පත්‍රයේ ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම, තොග හා සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව ඌරන් කුකුලන් ආදී	සත්ව ආහාර ගැනීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම හා එම ඒකක වලින් පාඩු සිදුවීම සමාගමට සෘජුවම බලපාන බැවින් ඌරු පාලනය ඉවත් කරන ලදි. පවතින මිල වෙනස්වීම් මත අලාභදායි	සමාගමේ මූලික අරමුණු සාර්ථකව ඉටුකිරීම සඳහා ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යායුතුය.

	සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම, අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන මූලික අරමුණු දක්වා තිබුණ ද ඒවා ඉටුකර ගැනීමේදී මීගව, එළ ගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් වර්ෂ ගණනාවක සිට සිදුකරමින් පැවතුණි. එසේ සුළු වශයෙන් සිදුකළ ඌරු පාලනය ආශ්‍රිත කටයුතු 2021 වර්ෂයේ සිට නතර කර ගොවිපොළ සතුව සිටි ඌරන් 2022 වර්ෂයේදී සම්පූර්ණයෙන් අලෙවි කර තිබුණි. බ්‍රොයිලර් කුකුළන් මසට අලෙවි කිරීමේ කටයුතු 2020 වර්ෂයේ සිට නවතා දමා තිබුණ අතර බාහිරින් බ්‍රොයිලර් කුකුළු මස් ලබාගෙන අලෙවි කිරීමද 2024 වර්ෂයේ සිට නවතා දමා තිබුණි. තවද 2024 වර්ෂයේ දී එළුවන් 139 ක් රු.2,794,310 ක මුදලකට අලෙවි කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය අවසානය වනවිට සමාගමේ ජීවී සතුන් ලෙස මී ගවයින් 143 ක් පමණක් ඉතිරිව සිටින බව නිරීක්ෂණය විය.	තත්ත්වයක් උද්ගත වූ බැවින් බ්‍රොයිලර් කුකුලන් අලෙවි කිරීම නවතා දමන ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය 2023 වර්ෂයේ සේවක අර්ථසාධක මුදල් ගෙවීම සඳහා එළුවන් අලෙවි කරන ලදි.	
(ආ)	ගිරාදුරුකෝට්ටේ සහ දම්මින්න ගොවිපොළ සතුව අක්කර 1154 ක පමණ භූමියක් පැවතියත්, එම භූමිය සමාගම විසින් වගා කටයුතු සඳහා ඵලදායී ලෙස යොදා ගෙන නොතිබුණි. සමාගමට ආදායම් උපයා ගැනීමේ මාර්ගයක් ලෙස සමාගම සතු භූමිය කන්න බදු ක්‍රමය යටතේ ගොවීන්ට බඩ ඉරිඟු වගාව සහ වී වගාව සඳහා බදුදීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ නමුත්, 2023/24 මහ කන්නය සඳහා ගිරාදුරුකෝට්ටේ ගොවිපොළෙන් බඩ ඉරිඟු වගාව සඳහා අක්කර 91.75 ක් ද, වී වගාව සඳහා අක්කර 11.5 ක් ද දම්මින්න ගොවිපොළෙන් 2023/24 මහ කන්නය සඳහා අක්කර 20 ක් පමණක් වී වගාව සඳහාද ලබාදී තිබුණි. ඒ අනුව සමාගම සතු භූමියෙන් අක්කර 123.25 ක් හෙවත්	2023/24 මහ කන්නය වෙනුවෙන් ඉඩම් බෙදාදීම සඳහා අනුමැතිය ලැබීමට ප්‍රමාදවීම නිසා ඉඩම් සඳහා ඉල්ලුම අඩුවිය.	භූමිය ඵලදායීව උපයෝගි කර ගැනීම සඳහා ඉඩම් බදු දීමේ ප්‍රමාණය වැඩිකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.අදාළ අනුමැතීන් ප්‍රමාදයකින් තොරව ලබා ගැනීම සිදු කළ යුතු අතර 2023/2024 මහ කන්නය වෙනුවෙන් අනුමැතිය ලබාගැනීමේ ප්‍රමාදයට වගකිවයුතු නිලධාරීන් වෙනුවෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

සියයට 10.6 ක් පමණක් 2024 වර්ෂයේ බදුදී තිබූ බව නිරීක්ෂණය විය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂිකව අයිස්ක්‍රීම් ලීටර 3000 ක් පමණ නිෂ්පාදනය කරන යන්ත්‍රය 2023 දෙසැම්බර් මස සිට ක්‍රියා විරහිත වීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු නතර කර තිබුණ අතර විගණිත දින වූ 2025 ජුනි 03 දින වනවිටත් එම යන්ත්‍රය අලුත්වැඩියා කර නොතිබුණි.	මෙම යන්ත්‍රය අලුත්වැඩියා කළ නොහැකි ලෙස ක්‍රියාවිරහිතවී ඇත.	යන්ත්‍රයේ නඩත්තු කටයුතු යාවත්කාලීනව සිදු නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිවයුතු නිලධාරීන් හඳුනා ගත යුතුය.
(ආ)	ගිරාදුරුකෝට්ටේ ගොවිපොළ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා රු. 9,338,000 ක් වූ භාණ්ඩ 2016 පෙබරවාරි 08 දින සමාගමට පවරාදී තිබුණද මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් ඇති කර නොගැනීම හේතුවෙන්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි.	වෙනත් පාර්ශවයක අවශ්‍යතාවය මත ඉදිකරන ලද මෙම ගොඩනැගිලි භාවිතයට ගැනීමට ප්‍රාග්ධන හැකියාවක් සමාගමට නොමැත.	මෙම ඉදිකිරීම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම සුදුසු ක්‍රමවේදයක් අනුව කළ යුතුය.